www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නැගෙනහිර ශ්‍රී ලංකාවේ පොලිස් ජන ඝාතනවලට එරෙහිව මුස්ලිම් ජනයා විරෝධය දක්වති

**Muslims protest against police massacre in eastern Sri Lanka**

**කේ. රත්නායක විසිනි**
**2006 සැප්තැම්බර් 21**

තරුන මුස්ලිම් කම්කරුවන් 10 දෙනෙකු ඝාතනය කිරීමට විරුද්ධව නැගෙනහිර ශ්‍රී ලංකාවේ පොතුවිල් ප්‍රදේශයේ පැවති විරෝධතා ව්‍යාපාරය ඊයේ තෙවන දිනයට ලඟා විය. ආන්ඩුව එම ඝාතනය සම්බන්ධයෙන් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට චෝදනා කිරීමට උත්සාහ කල නමුත් ප්‍රදේශවාසීන් චෝදනා කර ඇත්තේ විශේෂ කාර්ය බලකාය (එස්ටීඑෆ්) නමැති විශේෂිත පොලිස් කොමාන්ඩෝ ඒකකය වගකිව යුතු බවට යි.

ඉරිදා කම්කරුවන් 11 දෙනෙකු පොතුවිල්හි රත්තල් කුලම්හි සොරොව්වක් අලුත්වැඩියා කිරීමට ගිය නමුත් ඔවුන් ආපසු පැමිනියේ නැත. ඔවුන්ගෙන් 10 දෙනෙකුගේ සිරුරු පසු දින සොරොව්ව අසල තිබී සොයා ගන්නා ලදි. ඔවුන් ම්ලේච්ඡ ලෙස කපා කොටා මරා දමා තිබුනි. 55 හැවිරිදි මීරා මොහිදීන් දිවි ගලවා ගත් නමුත් බරපතල ලෙස තුවාල ලබා සිටි ඔහු දැන් අම්පාර රෝහලේ දැඩි සත්කාර ඒකකයේ සිටී.

මිහිදන් කිරීමට පෙර මල සිරුරු තබා තිබූ ජුම්මා පල්ලිය අසල රැස්ව සිටි 2,000ක පමන ජනකායෙන් එක් අයෙකු වූ එම්.එස්. මොහිදීන් රොයිටර් ප්‍රවෘත්ති සේවයට මෙසේ පැවසී යඃ "විශේෂ කාර්ය බලකාය මේ මිනිස්සු මැරුවා. අපි වෙන කිසි ම කෙනෙකුට චෝදනා කරන්නෙ නැහැ. එල්ටීටීඊයට මේ ප්‍රදේශයට එන්න බැහැ. මේ ප්‍රදේශය සම්පූර්නයෙන් ම පාලනය කරන්නෙ එස්ටීඑෆ් එක. එස්ටීඑෆ් එක නො දැනුවත්ව කිසි ම කෙනෙකුට මේ ප්‍රදේශයට එන්න බැහැ."

සඳුදා සිට ප්‍රදේශයේ කඩසාප්පු හා ව්‍යාපාරික ස්ථාන වසා දමාතිබේ. අසල සාස්තිරිවේලිහි පිහිටි පොලිස් කඳවුර ඉවත් කරන ලෙස නැති නම් කොමාන්ඩෝ ඒකකය මාරු කරන ලෙසත් එමෙන් ම මෙම අපරාධය සම්බන්ධයෙන් පූර්න පරීක්ෂනයක් පවත්වන ලෙසත් විරෝධතාකරුවෝ ඉල්ලා සිටිති. සාස්තිරිවේලි කඳවුර පිහිටා ඇත්තේ මල සිරුරු හමු වූ ස්ථානයට යන්තම් මීටර් 350ක් දුරිනි.

ප්‍රදේශවාසීහු තත්වය සමාලෝචනය කර ගැනීමට ගුවනින් එහි ගිය පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දුගේ වාහනය වට කර ගත්හ. බස්නාහිර පලාතේ ආන්ඩුකාර අලෙවි මවුලානා සමග ආන්ඩුවේ ඇමතිවරුන් වන ඒ.එච්.එම්. ෆවුසි සහ හුසේන් බායිලා වහා ම ප්‍රදේශයට ගොස් සන්සුන් වන ලෙස ආයාචන කල නමුත් එයින් පලක් නො වී ය.

අඟහරුවාදා 15,000ක් පමන ජනයා ජුම්මා පල්ලිය ඉදිරියේ රැස් වූ අතර අම්පාර දිස්ත්‍රික්කයේ වෙනත් ප්‍රදේශ ගනනාවක ම විරෝධතා පැවැත්වුනි. දෙමල ජනයා ද විරෝධතා ව්‍යාපාරයට සහභාගි වූහ. විරෝධතා අවසන් කිරීමේ මංමුලා සහගත ප්‍රයත්නයක් ලෙස යලිත් වරක් ප්‍රදේශයට සංචාරය කල ෆවුසි මිය ගිය අයගේ පවුල්වලට රුපියල් 100,000 බැගින් ප්‍රදානය කලේ ය.

බදාදා පෙරිය උල්ලෙයිහි මුස්ලිම් ජනයා පොතුවිල්හි විරෝධතාකරුවන් මැඩ ලීම සඳහා යමින් සිටි එස්ටීඑෆ් වාහනයක මග හරස් කලහ. ඉන් පසුව හට ගත් ගැටුමේ දී පොලිස් කොමාන්ඩෝ භටයන් වෙඩි තැබීමෙන් 14 දෙනෙකුට තුවාල සිදු විය. ඉන් සිව් දෙනෙක් බරපතල තුවාල ලැබූහ. තව දුර විරෝධතා ඇති වීම මැඩ ලීමේ පියවරක් ලෙස බ්‍රහස්පතින්දා උදේ වන තෙක් ප්‍රදේශයේ ඇඳිරි නීතිය පැනවීමට පොලීසිය ක්‍රියා කලේ ය.

ආන්ඩුවේ හා ආරක්ෂක හමුදාවන්ගේ ක්ෂනික ප්‍රතිචාරය වූයේ එල්ටීටීඊය මත වරද පැටවීම යි. එල්ටීටීඊයේ සම්බන්ධය ඔප්පු කිරීමට ප්‍රමානවත් සාක්ෂ්‍ය තිබෙන බව ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල ප්‍රකාශ කලේ ය. එස්ටීඑෆ් භටකාය වගකිව යුතු ය යන චෝදනා ප්‍රතික්ෂේප කල ඔහු පොලිස් කොමාන්ඩෝ භටයන්ට ප්‍රශංසා කලේ ය. සිද්ධියට තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බව ප්‍රකාශ කරමින් එල්ටීටීඊය නිවේදනයක් නිකුත් කර තිබේ.

ජාත්‍යන්තර පරීක්ෂනයක් ඉල්ලා ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ (ශ්‍රීලමුකො) නායක රාවුෆ් හකීම් කල ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරමින් රඹුක්වැල්ල මෙසේ ප්‍රකාශ කලේ යඃ "පූර්න පරීක්ෂනයක් කරන්න අවශ්‍ය විශේෂඥ දැනුම ශ්‍රී ලංකාව සතුව තියෙනවා." සඳුදා පොතුවිල්හි

ප්‍රදේශවාසීන් හමු වූ හකීම් මාධ්‍ය අමතා එස්ටීඑෆ් හටකාය සිද්ධියට වගකිව යුතු ය යන චෝදනාව යලි අවධාරනය කලේ ය. ජාත්‍යන්තර පරීක්ෂනයක් පිලිබඳ ඉල්ලීමට බල කරනු පිනිස තමන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරීන් හමු වන බව ද ඔහු නිවේදනය කලේ ය.

අපක්ෂපාතී පරීක්ෂනයක් පැවැත්වීම සම්බන්ධයෙන් පොලීසිය කෙරෙහි මහජන විශ්වාසයක් නැතිකම හකීම්ගේ යෝජනා මගින් පිලිබිඹු වේ. පසු ගිය වසර මුලුල්ලේ, ආරක්ෂක හමුදාවලට චෝදනා එල්ල වූ ඝාතන හා "අතුරුදන් වීම්" විශාල සංඛ්‍යාවක් දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වලින් වාර්තා වී තිබේ. ආන්ඩුව ඒ සම්බන්ධයෙන් පරීක්ෂන පැවැත්වීමට පොරොන්දු වී ඇති මුත් ආරක්ෂක හමුදාවල එකදු සාමාජිකයෙකු වත් චෝදනාවන්ට හා නඩු විභාගයන්ට ලක් කොට නැත.

පොලීසියට එරෙහි විරෝධතා ව්‍යාපාර දේශපාලනිකව අර්ථභාරී ය. අතීතයේ දී, දිවයිනේ නැගෙනහිර පලාතේ මුස්ලිම් ජනයාට එරෙහි ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් එල්ටීටීඊය වගකිව යුතු විය. මුස්ලිම් ජනයා හා දෙමල ජනයා අතර වෛරය අවුලුවනු වස් ආනුෂංගික කොලඹ ආන්ඩු විසින් එම සිද්ධීන් පෙරලා යොදා ගන්නා ලදි. ඝාතනවලට පොලීසියේ සම්බන්ධය පෙන්නුම් කලා සේ ම, මිලිටරියේ ම්ලේච්ඡ විධික්‍රමවලට එරෙහිව පුලුල්ව පැතිරුනු වෛරය මධ්‍යයේ, මේ විරෝධතා වාර්ගික බාධක බිඳ හෙලීමක් ද පෙන්නුම් කලේ ය.

මුස්ලිම් කම්කරුවන් ඝාතනය සිදු වූයේ විශේෂයෙන් ම නැගෙනහිර පලාත තුල මිලිටරිය විසින් එල්ටීටීඊයට එරෙහිව දියත් කරන ලද ප්‍රහාරාත්මක මෙහෙයුම් මාලාවකට පසුව ය. 2002 සටන් විරාමය විවෘතව ම උල්ලංඝනය කරමින් ජනාධිපති මහින්ද රාජපක්ෂගේ අන පරිදි හමුදාව ත්‍රිකුනාමලයට දකුනින් එල්ටීටීඊ භූමි ප්‍රදේශය තුල පිහිටි මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීමේ ප්‍රධාන මෙහෙයුමක් දියත් කලේ ය. ඉන් පසුව ආරක්ෂක හමුදාවන් ත්‍රිකුනාමල වරාය පිහිටි බොක්කේ අනෙක් පස වන සාම්පූර් ප්‍රදේශයේ එල්ටීටීඊ බල මධ්‍යස්ථාන අල්ලා ගෙන තිබේ.

ඊට පෙර අගෝස්තු මස, බහුතර මුස්ලිම් ජනගහනයකින් යුක්ත මුතූර් නගරයේ පාලනය අරබයා දරුනු සටනක් පැවතුනි. මාවිල්ආරු වෙත වන හමුදාවේ සැපයුම් මාර්ග කපා හැරීමේ ප්‍රයත්නයක් ලෙස එල්ටීටීඊ සටන්කරුවෝ නගරයේ කොටස් අල්ලා ගත්හ. දරුනු කාල තුවක්කු හා රොකට් ප්‍රහාර මාලාවකින් මිලිටරිය එයට ප්‍රතිචාර දැක්වූයේ දසදහස් සංඛ්‍යාත වැසියන් නගරයෙන් පලවා හරිමිනි. හමුදාව මුතූර් නගරය යලි අල්ලා ගැනීමෙන් පසුව, අගෝස්තු 5 දා ප්‍රාදේශීය සහන සේවකයන් 17 දෙනෙකුගේ මල සිරුරු එහි තිබී හමු විය. ඔවුන්ගෙන් වැඩි දෙනා දෙමල ජාතිකයෝ වූහ. ඔවුන් මරා දමා තිබුනේ අලුගෝසු ශෛලියෙනි. මිලිටරිය ඒ සම්බන්ධයෙන් එල්ටීටීඊය මත වරද පැටවූ අතර සටන් විරාමය අධීක්ෂනය කරන ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව නිගමනය කලේ හමුදාව ඒ සඳහා වගකිව යුතු බව යි.

ඉන් දින දෙකකට පසුව, සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ආධාරකරුවෙකු වූ සිවප්‍රකාසම් මරියදාස් ඒ ආසන්නයේ පිහිටි ගම්බද නගරයක් වන මුල්ලිපොතානේ ඔහුගේ නිවසේ දී අලුගෝසු ශෛලියකින් වෙඩි තබා ඝාතනය කරන ලදි. සියලු ම සාක්ෂ්‍ය මගින් පෙන්නුම් කෙරෙන්නේ ඔහුගේ ඝාතනයට හමුදාව සම්බන්ධ බව යි. සසපය සහ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* මෙම අපරාධය සම්බන්ධයෙන් පූර්න පරීක්ෂනයක් සහ මරියදාස්ගේ ඝාතකයන්ට එරෙහිව නඩු පැවරීම ඉල්ලා ජාත්‍යන්තර උද්ඝෝෂනයක් ගෙන යමින් සිටී (බලන්න: ශ්‍රී ලංකාවේ සසප, සිවප්‍රකාසම් මරියදාස් ඝාතනය පිලිබඳව පූර්න පරීක්ෂනයක් ඉල්ලයි).

ඝාතන රැල්ල අහම්බයක් නො වේ. 2004 දී එල්ටීටීඊ සංවිධානය තුල සිදු වූ මූලික භේදයක් මගින් එහි සටන් හමුදාවන් තීරනාත්මක ලෙස දුර්වල වී ඇතැයි ගනන් බලමින් නැගෙනහිර පලාතේ සැලකිය යුතු ප්‍රදේශ එල්ටීටීඊය අතින් යලි අල්ලා ගැනීමට ආන්ඩුව සහ මිලිටරිය මාන බලයි. කරුනා නමින් ප්‍රසිද්ධ එල්ටීටීඊයේ හිටපු අන දෙන නිලධාරී වී. මුරලිදරන් සංවිධානයෙන් භේද වී එතැන් පටන් එල්ටීටීඊයට එරෙහි ප්‍රහාරවල දී හමුදාව සමග සමීප සහයෝගයකින් ක්‍රියා කරමින් සිටී. පසු ගිය දින දෙක තුල දී ගුවන් හමුදාව නැගෙනහිර පලාතේ මඩකලපුව නගරය අසල එල්ටීටීඊ කඳවුරු වෙත එල්ල කරන සිය ප්‍රහාර උත්සන්න කර තිබේ.

යුද්ධය උත්සන්න කිරීම උතුරේ හා නැගෙනහිර සමස්ත ජනතාව ම ත්‍රස්ත කිරීමේ එල්ලයෙන් යුතුව ගෙන යන මර්දන ව්‍යාපාරයක් සමග එකට බැඳී තිබේ. පොතුවිල්හි වැසියන් පවසන පරිදි, එස්ටීඑෆ් හටකාය ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය (ජාහෙඋ) වැනි සිංහල ස්වෝත්තමවාදී පක්ෂ සමග එක්ව ප්‍රාදේශීය ජනතාව භේද කරනු පිනිස වාර්ගික ආතතීන් ඇවිලවීමේ උත්සාහයක හිතාමතා ම යෙදී සිටී. කම්කරුවන් 10 දෙනා ඝාතනය කිරීමත් එම එල්ලය ජය ගනු වස් ගනන් බලා සිදු කල ක්‍රියාවක් වීමට ඉඩ තිබේ.

එක් ප්‍රදේශවාසියෙක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසී ය: "සිංහල, දෙමල, මුස්ලිම් ජනයා සමගියෙන් ජීවත් වෙච්ච සමගියෙන් ජීවත් වෙන්න

බලාපොරොත්තු වෙන ප්‍රදේශයක් මේක. එස්ටීඑෆ් එක, විශේෂයෙන් ම ප්‍රදේශයේ සිටින ඒකෙ ප්‍රධානියා, මෙහි දී (අපරාධයේ දී) මූලිකත්වය අර ගෙන තියෙනවා. ඒක යි මිනිස්සු ඒක අයින් කරන්න කියල ඉල්ලන්නෙ.

"ජවිපෙත් හෙල උරුමයත් එස්ටීඑෆ් එකට සහයෝගය දෙනව. මේ සංවිධාන දෙක මුස්ලිම් ජනයාට මුලුමනින් ම හතුරු යි. මහජනයා අතර තියෙන එකමුතුකම බිඳින්න යි ඔවුන්ට ඕන. 2005 මුල දි මේ මිනිස්සුන්ගෙ සහයෝගයෙන් උල්ලෙයිවල බුදු පිලිමයක් ඉදි කලා. මේකෙන් වාර්ගික ආතතීන් ඉහල ගියා. මේ යුද්ධයේ එල්ලය අපේ සමගිය බිඳ දාන එක යි. අපි හැමෝට ම ඕන එකට ජීවත් වෙන්න යි."

© www.wsws.org